# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2234/20 - 2021 ජුනි මස 30 වැනි බදාදා - 2021.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජුනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2021 අංක 6 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. විදේශ විනිමය නියෝග ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් විදේශ ව්‍යවහාර ණය මුදලක් ලබාගෙන ඇති, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගම් (2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත අනුව මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වන සමාගම් හැර) සඳහා, එම ණය මුදලින් සියයට පනහක් (50%) යොදා ගනිමින්, පහත නියම සහ කොන්දේසිවලට යටත්ව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව, ද්විතීයික වෙළෙඳපොළෙන්, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීමට මෙයින් අවසර ප්‍රදනය කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එවැනි ඉල්ලුම්පත් සලකා බලා, එක් එක් ඉල්ලීම මත පදනම්ව අනුමැතිය ලබා දෙනු ඇත.

1A - PG 5479 — 470 (2021/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) එම ණය මුදලින් ඉතිරි සියයට පනහක (50%) මුදල ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා වන අරමුදල් ප්‍රභවයන්, විදේශයන්ගෙන් බාහිර ණය ගැනීම් පමණක් ම විය යුතු අතර, ශ්‍රී ලංකාවට ආමුඛ ප්‍රේෂණ ලෙස ලැබිය යුතු ය.

(iv) විදේශ ණය ලබා ගැනීම් සඳහා පවතින, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝගවලට යටත්ව, සුදුසුකම්ලත් සමාගම් විසින් බලයලත් වෙළෙන්දකු සමග විවෘත කරන ලද, විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමකට එම ණය මුදල් ලබාගත යුතු අතර ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සම්බන්ධයෙන් වන සියලු ප්‍රේෂණ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව, එම විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම හරහා සිදු කළ යුතු ය.

(v) එසේ අත්පත් කරගන්නා ලද ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කල්පිරීමෙන් ලද මුදල් සහ කූපන් (coupons) ලැබීම්, එම ආයෝජනය සිදු කරන ලද විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමේ බැරට ආපසු ගෙන එනු ලැබිය යුතු ය.

(vi) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල අනුරූප ආයෝජනයන්හි කූපන් (coupons) ලැබීම් සහ කල්පිරීමෙන් ලද මුදල් ලැබීමට එදිරිව ගැළපෙන පරිදි අනුරූප ණය ලබාගැනීම්වල පොළිය සහ ප්‍රාග්ධනය ආපසු ගෙවීම (ණය ගැනුම්කරු සහ ණය ලබාදෙන්නා අතර එකඟ වූ පරිදි) සැලසුම් කළ යුතු ය.

(vii) කිසිඳු අවස්ථානුගත කරුණක් යටතේ, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීමේ කාර්යය සඳහා විදේශයන්ගෙන් ලබාගත් එම ණය මුදල් ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම මගින් ආපසු ගෙවීම සිදු නොකළ යුතු ය.

(viii) තව ද, බලයලත් වෙළෙන්ද සෑමවිටම, සුදුසුකම්ලත් සමාගම් විසින් යථායෝගී ව කටයුතු කරන බව සහ නියෝගවලට අනුකූලවීම සහතික කළ යුතු ය.

07 - 177

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.